

'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු

| 59 වන කාණ්ඩය | බු.ව. 2560 වප් මස පුරපසළොස්වක ද ව්‍ය.ව. 2016 ඔක්තෝම්බර් මස 15 වන ද | 06 වන කලබ |
|---|---|---|

# ලෝක ළමා දිනයට

මුළු ලොවට සුවඳ සලනා
මල් කිනිති රුවට දිලෙනා
ගුණ සුවඳ සමඟ සොඳිනා
අපි දිලෙමු දිලෙමු නිතිනා

රන් කරල් කෙතෙහි සැදෙනා
කිරි වැදී සරු ව සැලෙනා
ගුණ - නැණින් ඉසුරු මවනා
නව ලොවට අපි යි අගනා

මුළු රටට පිපෙන මල් වී
ගුණ පවුරු බඳිමු අත් දී
පටු ඉවුරු බිඳැර තොස් වී
අපි පෙරට ඇදෙමු එක් වී

*අනඳ*



# අනගාරික ධර්මපාල තුමා පිළිබඳ මගේ හැඟීම්

*ගරු අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති ධුරය දැරූ*
*අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මහතා විසිනි*

"පුළුල් නළල් තලය පසු කොට පීරා හළ කළු වන් කෙස් කලඹ විසුරුවා තම තියුණු පැහැදිලි නෙත් සගළ සභාව කෙරෙහි රඳවමින් පිළිරුවු දුන් තම වදන් පෙළ අනුව සිය දිගු දුඹුරු වන් ඇඟිලි ලෙළවමින් ඔහු ධර්ම ප්‍රචාරකයකු ගේ ඒකාන්ත ප්‍රතිමූර්තියක් පළ කළා මතු නොවේ. සමස්ත ශිෂ්ට ලෝකයෙහි 'ආසියාවේ ආලෝකය' පතුරුවා හැරීමෙහි හා සකල බුද්ධ ශ්‍රාවකයන් සුප්‍රීත කරනු සඳහා ද අරඹන ලද ව්‍යාපාරයක නායකත්වයෙහි මෙ බඳු පුද්ගලයකු සිටිනු දැන ගන්නට ලැබීම රෝමෝද්ගමනය ඇති කරවන්නක් ද විය."

ඉහතින් උපුටා දැක්වුණේ 1883 වසරේ චිකාගෝ නගරයෙහි පැවැත්වුණු සමස්ත ලෝක ආගම් සමුළුව අමතමින් අනගාරික ධර්මපාල තුමා අනුස්මරණීය දේශනයක් කළ අවස්ථාවෙහි සමකාලීන අමෙරිකානු පුවත් පතක් (සෙන්ට් ලුවිස් ඔබ්සර්වර්) පළ කළ ලිඛිත චිත්‍රයකි.

කොළඹ පැවැත්වුණු ප්‍රසිද්ධ රැස්වීමක දී අනගාරික ධර්මපාල තුමා පළමු වරට දැක බලා ගැනීමට මට හැකි වූයේ ඉහත සඳහන් වැදගත් සිද්ධියෙන් තිස් වසරකට පමණ පසු ව ය. කාලය ගෙවී ගිය ද (එවකට එ තුමා වයස පනස් ගණන්වල පසු විය.) එ තුමා ගේ විශිෂ්ට කායික ලක්ෂණවල දක්නට ලැබුණේ ඉතා මඳ වෙනසකි. ප්‍රබල ශක්තියක් උද්වහනය කළ එ තුමා ගේ ප්‍රවෙගික පෞරුෂය සකල සභාව පුරා පැතිර ගියේ ය. එ තුමා ගේ නින්නාද දුන් කථා ශබ්දය සභා ශාලාව පුරා රැවු දෙමින් ශ්‍රාවක ජනයා ගේ සිත් සතන් තුළ එ තුමා කෙරෙහි ගෞරව බහුමානයක් දැනවී ය. රිදී සීනුවකින් නැගුණු වැනි එ තුමා ගේ කතාව විටෙක කටුක වුව ද, මිතුරා ගේ මෙන් ම සතුරා ගේ ද හද බැඳ ගැනීමෙහි සමත් විය. එසේ වූයේ මේ වදන් ගලා ආවේ ජ්වලිත ජාත්‍යාලයකින් හා ආගමික භක්තියකින් පිරුණු අවංක හදවතකින් බව සියල්ලන් දැන සිටි හෙයිනි.

මගේ තුරුණු වියේ මුල් කාලයෙහි, මේ ශ්‍රේෂ්ඨ ප්‍රතිසංස්කාරකයාණන් ගේ බල පෑමට හසු වීමෙන් මගේ ඉන් අනතුරු දිවි පෙවෙතත් ජීවිතයේ අරමුණත් වෙනසකට පත් විය. ජාතික පුනර්ජීවයක් සඳහා එ තුමා දැරූ වීරෝදාර ප්‍රයත්නයත් බුදු දහම පතුරුවා හැරීම සඳහා එ තුමා දැරූ විපුල උද්යෝගයත් ලෞකික ලාභයන් ගේ ආටෝපය හෙළා දකිමින් මගේ මවු බිමෙහි වෙසෙන සාමාන්‍ය ස්ත්‍රී පුරුෂයන් ගේ ඉරණම කෙරෙහි ඇප කැප වනු වස් මා පොලොඹවා ලී ය. එ තුමා ගේ

වීර්යවත් චරිතයත් සත්‍යය, අවංකත්වය හා සෘජුත්ව යන අක්ලිෂ්ට ගුණාංගයත් මගේ ජීවිතයෙහි බලාපොරොත්තු සුන් ව සිටි අඳුරු ම මොහොතෙහි පවා මට මඟ පෙන්වූ ආලෝකධාරා විය.

වරදෙහි සුපරීක්ෂාකාරී වූ අනගාරික ධර්මපාල තුමා තමාට වුව සපුරා නො පිළිපැදිය නොහැකි කිසිත් කැල ම නො දෙසී ය. එ හෙයින් එ තුමා තම සමීපතම ආශ්‍රිතයන් අතරෙහි පවා ආත්මවංචනයත් උදාසීනත්වයත් නො ඉවසී ය. සතුරන් ඇති වීමේ අවදානම දකිමිනුත් උදැල්ල උදැල්ල ලෙස හැඳින්වීමට එ තුමා පසු බට නො වී ය. එ තුමා ගේ හැම ක්‍රියාවක් ම ඉතා පැහැදිලි හෘදය සාක්ෂියෙන් මෙහෙයැවුණේ විය.

එ තුමා ගේ සති පතා ප්‍රකාශනය වන "සිංහල බෞද්ධයා" පත්‍රය 1931 දී භාර ගතිමි. ජාතික පුනරුදය අරමුණු කොට ගත් මේ ප්‍රබල ප්‍රකාශනය ඇරඹියේ ද එ තුමා ය. බෞද්ධ මතය ප්‍රකාශයට පැමිණවූ මේ පුවත් පත අනගාරික ධර්මපාල තුමා ගේ ජාතික හා ආගමික ව්‍යාපාරයට අනුබල සපයනු පිණිස සිරිලක පුරා බෞද්ධ මහජන මතය සකස් කිරීමෙහි ලා වැදගත් මෙහෙයක් ඉටු කළේ ය.

මේ කාලය වන විට එ තුමා දඹදිව තම අඛණ්ඩ ප්‍රයත්නයේ අග්‍ර ඵලය ලෙස හැඳින්විය හැකි බරණැස සාරානාථය බලා නික්ම ගොස් සිටියේ ය. එහෙත් එ තුමා මා සමඟ නො කඩවා ලිපි ගනුදෙනු කිරීමෙහි

යෙදී සිටියේ ය. "දැනගත යුතු කරුණු" නමැති සඟරාවට සතිපතා ඉදිරිපත් කළ සුප්‍රකට ලිපිය නො කඩව එවීම කිසි කලෙකත් එ තුමා පැහැර නොහළේ ය. මා හා සමීප සම්බන්ධයක් පැවැත්වූ මේ කාලය තුළ එ තුමා ගෙන් අපමණ ආභාසයත් මගේ මාතෘ භූමිය උදෙසා පසු කලක සේවය කිරීමට මා පෙළඹවූ මාර්ගෝපදේශකත්වයත් ලද්දෙමි.

අනගාරික ධර්මපාල තුමා සිය රටටත් සිංහල ජාතියටත් ඇලුම් කළ ශ්‍රේෂ්ඨ දේශ ප්‍රේමියෙකි. එසේ වුව ද එ තුමා ගේ දර්ශනය අන්තර්ජාතික විය. සැබෑ සැටියෙන් ම එ තුමා ජගත් පුරුෂයෙක් විය. ජාති, ආගම්, දේශ වශයෙන් පැවති බාධක නො තකා හළ යෝධ පුරුෂයෙක් විය. ඉන්දියාවේ පීඩිත පන්තියේ දරුවෝ වෙත් වයි හාලම්හි වෙසෙන නීග්‍රෝ දරුවෝ වෙත් වයි ඊස්ට් එන්ඩ්හි පැල්පත්වල විසූ අන්ත දුගී දරුවෝ වෙත් වයි මේ සියල්ලෝ ම ලංකාවෙහි දරුවන් සේ ම එ තුමා ගේ හදවතට ඉතා සමීප වූහ.

අසරණයන් හා දුබලයන් කෙරෙහි එ තුමා දැක්වූ දයාවත් දක්ෂිණ්‍යයත් අසීමිත විය. ලංකාවේ වේ වයි, ඉන්දියාවේ වේ වයි, අමෙරිකාවේ වේ වයි ශක්තිමතා හා ප්‍රබලයා විසින් දුබලයාත් වරප්‍රසාද නොලද්දුත් ගසා කනු ලැබීම එ තුමා හෙළා දුටුවේ ය. එ තුමා ලෝකයේ දැනගැනීමට පාත්‍ර වූ කවර ප්‍රදේශයක වුව ද වෙසෙන ලක්ෂ කෝටි සංඛ්‍යාත ජනයාට කාමභෝගී ජීවිතය

හැර පියා ආධ්‍යාත්මික සම්පත්තිය ළඟා කර ගැනීමට අවශ්‍ය ප්‍රබෝධයත් උනන්දුවත් සපයා ඔවුන් ධෛර්යවත් කරවී ය.

එ තුමා ගේ ජීවිතය වූ කලී අධික කාර්ය භාරයකින් යුත් වූවකි. එ සේ ම එය මිනිස් වගට සෙත සැලසීම පිණිස කැප කරන ලද්දක් මෙන් ම සෑම ලංකා පුත්‍රයකු විසින් ආදර්ශයට ගැනීමට තැත් කළ යුතු මනා ජීවිතයක් ද වෙයි.

## සිරි වජිරාරාමයේ කඨින පූජෝත්සවය

බම්බලපිටියේ සිරි වජිරාරාමයේ කඨින චීවර පූජා පින්කම මෙම ඔක්තෝම්බර මස 22, 23 දෙදින පැවැත්වේ. 22 (සෙනසුරාදා) රාත්‍රී 8.00 ට පරිත්‍රාණ දේශනය ආරම්භ වේ. පසුදා (23) උදේ 4.30 ට සිරි වජිරාරාම දහම් පාසලේ දරුවන් ගේ විසිතුරු මල්කම්වලින් සැදුණ කඨින පූජා පෙරහර බම්බලපිටියේ වජිර පාරේ එල්. එච්. පියසේන මහතා ගේ නිවසින් පිටත් වේ. උදේ 6.00 ට කඨින චීවරය සඟ සතු කිරීම අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස අනුනාහිමිපාණන් වහන්සේ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. එදින පස්වරු 6.00 ට කඨිනානිසංස ධර්ම දේශනය ශාස්ත්‍රපති පණ්ඩිත පූජ්‍ය හක්මන සුමනසිරි හිමිපාණන් විසින් පවත්වනු ලැබේ.

ළමා පෙළට මඟුල් සුතුර - 5



# පුබ්බේ ච කතපුඤ්ඤතා
# පෙර පින් කළ බව

පෙර පින් කළ<br>
දන හැම කල<br>
කුසලෙහි පල<br>
ලබති විපුල

කළ පින් ඇති<br>
දනෝ ගුණැති<br>
පින් ම කරති<br>
සුවපත් වෙති

පෙර පින් ඇති<br>
යහපත් ගති<br>
ඇති අය නිති<br>
සුව ම ලබති

ඔබ කළ පින<br>
ගෙවෙයි නිතින<br>
නො රැඳී පින<br>
ලබනු නිවන

පින් නැත්තෝ<br>
දුක් ගත්තෝ<br>
පව් ගැත්තෝ<br>
කඳු ළැත්තෝ

*- "ගුරු සීයා" විසිනි*



# අධිමුත්ත සාමණේරයන් වහන්සේ

*අතිපූජ්‍ය රේරුකානේ චන්දවිමල මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ*

අධිමුත්ත සාමණේරයෝ සංකිච්ච තෙරුන් වහන්සේ ගේ ගෝල නමකි. දිනක් සංකිච්ච තෙරුන් වහන්සේ සාමණේරයන් අමතා "සාමණේරය, දැන් තෙපි වැඩිවිය පැමිණ සිටින්නාහු ය. උපසම්පදා කරවීමට මාපියන් වෙත ගොස් වයස විචාරා එව"යි කීහ. සාමණේරයෝ පා සිවුරු ගෙන මාපියන් ගේ ගමට යන්නාහු අතර මග පිහිටි සොරුන් වෙසෙන මහ වනයෙන් මොබ නැගණියන් ගේ ගෙයි දන් වළඳා තමන් වහන්සේ ගේ වයස විචාළහ. නැගණියෝ, එය තමන් නොදන්නා බවත්, මෑණියන් දන්නා බවත් කියා "මෑණියන් වෙත ගොස් අසනු මැනව"යි කීහ.

සාමණේරයෝ මෑණියන් වෙත යන්නාහු සොරුන් වෙසෙන වනයට ඇතුළු වූහ. සොරුන් ගේ දූතයෙක් උන්වහන්සේ දැක පැවිද්දකු වනයෙහි එන බව සොරුන්ට දැන්වීය. සොරු මග රැක සිට සාමණේරයන් අල්ලා ගත්හ. ඒ සොරුන්ගෙන් ඇතැමෙක් සාමණේරයන් මරා

දමන්නටත්, මුදා හරින්නටත් කථා කළහ. ඔවුන් ගේ කථා ඇසූ සාමණේරයෝ මම තව ම මහණ දම් පුරා අවසන් නො කෙළෙමි. මොවුන් විසින් මා මරා දැමුවහොත් මේ අත්බැව්හි මට රහත්වන්නට නො ලැබෙන්නේ ය. මොවුන් හා කථා කොට මාගේ ජීවිතය රැක ගත යුතු යි සිතා සොර දෙටුවා අමතා ඇවැත්නි, මම ඔබට උපමාවක් කියන්නෙමි.

"පෙර මහ වනයක මිනිසෙක් උගුලක් අටවා සාවකු මැරී ය. සාවා මැරී සිටිනු දුටු මෘග පක්ෂීහු සැම දෙන ම මෙහි නපුරක් ඇත්තේ යයි එක් රැයකදී ම ඒ වනය හැර ගියෝ ය. එසේ ම කිසි ධනයක් නැති ශ්‍රමණයකු මේ වනයෙහි දී මැරුවහොත් පැවිද්දකුටවත් බේරී යන්නට නො ලැබෙන මේ වනයට ඉන් පසු කිසිවෙක් නො එන්නාහ. ඉන්පසු ඔබට මඟීන්ගෙන් ධනය පැහැර ගන්නට නො ලැබෙන්නේ ය"යි කීහ. එකල්හි සොර දෙටුවා මේ සාමණේරයන් කියන දෙය සැබෑ ය. මුන් වහන්සේ මැරුවහොත් මින් පසු මේ මග මිනිස්සු නො එන්නාහ. අපට මින්පසු ධනය නො ලැබී යන්නේ ය'යි වනයෙහි සොරු ඇති බව මඟ යන එන කිසිවකුට නො කියන ලෙස පොරොන්දු කරවා ගෙන සාමණේරයන් මුදා හැරියේ ය.

ඉදිරියට යන්නා වූ සාමණේරයන්ට තමන් ගේ මා පිය දෙදෙනා හා සහෝදරයා ද, සහෝදරී ද ඒ මඟ එනු හමු වූහ. සත්‍යයෙහි පිහිටි සාමණේරයෝ වනයෙහි සොරු ඇති බව ඔවුනට ද නො කීහ. තමන් ගේ මා පියන් රැක ගැනීමට ද පොරොන්දු කඩ නො කළහ. සාමණේරයන්

ගේ නෑ පිරිස සොරුන් විසින් අල්ලා ගන්නා ලදහ. සොරුන් ඔවුනට පීඩා කරන කල්හි සාමණේරයන් ගේ මෑණියෝ "මේ අන්තරාය දැන දැන ද අධිමුත්තෝ අපට නො කීහ" යි කියමින් ළයෙහි අත් ගසමින් හඬන්නට පටන් ගත්හ. අධිමුත්තයන් ගැන කියමින් හඬනු අසා සොර දෙටුවා ඇගෙන් තොරතුරු විමසූ කල්හි "මම අධිමුත්ත සාමණේරයන් ගේ මව ය. මේ පියා ය. මේ සහෝදරිය හා සහෝදරයා ය. අධිමුත්ත කළේ මහ අපරාධයෙක. මේ අන්තරාය දැන දැන ම අධිමුත්තයෝ අපට නො කීහ"යි කීහ.

එකල්හි සොර දෙටුවා "මෙය ධර්මයෙන් ජීවත් වන ආර්‍යයන් ගේ සැටි ය. අධිමුත්ත සත්‍යවාදියෙක, සත්‍යයෙහි පිහිටියෙක, පොරොන්දු කඩ නොකරන්නෙක, ඒ නිසා නුඹලා ගේ ඒම උන්වහන්සේ විසින් වළක්වා නැත. අධිමුත්තයන් වහන්සේ ගේ සත්‍යවාදීත්වය නිසා නුඹලා ද මුදාහරින්නෙමි"යි ඔවුන් හැම දෙන ම මුදාහැර, ඒ කාරණයෙන් පැහැදුණා වූ සොරු සියලු දෙනා ම සාමණේරයන් වහන්සේ යටතේ පැවිදි වූහ. සාමණේරයෝ සොරුන් පන්සියය ද ගෙන තමන් ගේ ආචාර්‍යවරයන් වෙත ගොස්, තමන් පළමුවෙන් උපසම්පදාව ලබා සොරු පන්සියය තමන් වහන්සේ ගේ අතවැසියන් ලෙස උපසම්පදා කරවූහ. ඒ හැම දෙනා ම අධිමුත්තයන් වහන්සේ ගේ අවවාදයෙහි පිහිටා මහණ දම් පුරා රහත් ව නිවන් දුටහ.



# වස් කාලයේ සුවිශේෂතාව

*සිරි වජිරාරාමවාසී*
*ශාස්ත්‍රපති පූජ්‍යපාද කුරුණෑගල චරණධම්ම හිමියන් විසිනි*

පින්වත් දූවේ පුතේ, වප් මස පුර පසළොස්වක දිනයේ ඇති සුවිශේෂතා අතර තිබෙන වැදගත් කාරණයක් තමයි වස්සාන කාලය නිමාවීම. උපසපන් ස්වාමීන් වහන්සේලා ඇසළ පොහෝ දින පටන් තුන් මාසයක් භාග්‍යවතුන් වහන්සේ ගේ නියමය පරිදි පෙරවස් සමාදන්ව චාරිකාවෙන් බැහැරව එක් ස්ථානයක රැ දෙමින් වාසය කළ යුතු වනවා. එම තුන් මාසයක කාලය අවසන් වන්නේ අදවන් පොහෝ දිනකයි. මේ විදිහට එක් තැනක ම වාසය කිරීමෙන් ලද විවේකය තම ආධ්‍යාත්මික දියුණුව සඳහා භාවිත කොට බොහෝ භික්ෂු භික්ෂුණී පිරිස් අතීතයේ දී සසර ගමන නිමා කොට සව් කෙලෙසුන් නසා රහත්භාවයට පත් වුණේ මේ වස් කාලය තුළ දී. එම තුන් මාසය පුරාවට ගිහි පින්වතුන් වෙනදාටත් වඩා උනන්දුවකින් ස්වාමීන් වහන්සේලා ගේ ප්‍රත්‍යය පහසුකම් පිළිබඳ සොයා බලා උන් වහන්සේලාට පහසුව සැලසීම තුළින් ඔවුනුත් විශාල පුණ්‍ය සම්භාරයක් රැස් කර ගනු ලබනවා.

වර්තමාන කාලයේත් විහාරස්ථාන ඇසුරු කර ගනිමින් වසරේ අන් කාලයනට වඩා පින්කම් සිදු කිරීම වස් තුන් මාසයේ සිදු වෙනවා. ධර්ම දේශනා, විවිධ ආකාරයේ වන්දනාවන් හා පූජාවන්, භාවනා වැඩසටහන් ආදී මේ කටයුතුවලට සම්බන්ධ වී කටයුතු කිරීම වාගේ ම තුන් මාසයක් පුරාවට සංඝෝපස්ථානය ඉතා සැලකිල්ලෙන් ඉටු කිරීමෙනුත් ගිහි පින්වතුන් විශාල පුණ්‍ය කාලයක් ලෙසින් වස් තුන් මාසය තුළ කටයුතු සිදු කරගෙන යනු ලබනවා. ස්වාමීන් වහන්සේලාත් එම විවේකය පාවිච්චි කරමින් තම පැවිදි දිවියේ කටයුතු වඩා හොඳින් සිදු කර ගන්නවා.

වස් සමාදන් වීමට ශික්ෂාපදයක් පැනවීම සිදුවන්නේ මහජන ඉල්ලීමකට අනුවයි. බුද්ධ කාලයේ විසූ අනෙක් ශ්‍රමණ කොටස් වස් කාලය තුළ එක් ස්ථානයක විසීමත් භික්ෂූන් චාරිකාවේ යෙදීමත් නිසා තමයි මේ ඉල්ලීම සිදුකළේ. එයත් භාග්‍යවතුන් වහන්සේගේ සහනශීලිත්වය සහ අන් අයට ඇහුම්කන්දීමේ සුවිශේෂී ගුණයන් ප්‍රකට කරන අවස්ථාවක් ලෙස හඳුන්වන්න පුළුවන්.

වස් කාලය හා සම්බන්ධ පිළිවෙත් චාරිත්‍ර බොහොමයක් පවතිනවා. ඒ අතර වැදගත් එකක් තමයි වස් සමාදන් වන භික්ෂූන් වහන්සේලා මේ කාලය පුරා ම මනා සිහියකින් කටයුතු කිරීම. තමන් වහන්සේ විහාරයෙන් බැහැර වන සෑම විටක ම වස් සමාදන්ව ඇති බව සිහි තබා ගනිමින් නැවත විහාරයට වඩින වේලාව පිළිබඳ සැලකිල්ලෙන් බැහැර විය යුතු වෙනවා. විහාරයෙන් බැහැර වූ සෑම අවස්ථාවක ම සත් දිනක් ඉක්ම යන්නට මත්තෙන් විහාරයට නැවත පැමිණෙන බව අධිෂ්ඨාන කොට පිටත්

විය යුතු යි. මේ ආකාරයට මනා සිහියෙන් කටයුතු කරන කොට වස් සිඳීමක් නොවී වාසය කිරීමට සැලකිළිමත් වෙනවා. ස්වාමීන් වහන්සේලා වස් සමාදන්වන ක්‍රම දෙකක් තිබෙනවා ඒ පෙරවස් සමාදන් වීම සහ පසුවස් සමාදන් වීම යි. පෙරවස් සමාදන්විම ඇසළ පොයෝ දිනට පසුදාත් පසුවස් සමාදන් විම නිකිණි පොහෝ දිනට පසු දිනත් සිදු කරනවා. පෙරවස් සමාදන් වීම යම් කරුණක් නිසා මගහැරුණු භික්ෂූන් වහන්සේ පසු වස් සමාදන් විය යුතුයි.

වස් කාලය තුළ පමණක් පරිභෝග කළ හැකි වැසි සළුව නම් සිවුරක් ගැනත් සාසන ඉතිහාසයේ සඳහන් වෙනවා. මේ වැසි සළුව මුළු සිරුර ම වැසෙන සේ භාවිත කළ හැකි එකක් බව අනුමාන කළ හැකියි. වස් වසන සේනාසනයත් ස්ථිර වාසස්ථානයක් ම විය යුතුයි. සෙවිලි කළ කුටියක් විය යුතුයි. එවැන්නක් නොමැති නම් දායකයන් ලවා සාදවා ගැනීමටත් එසේත් නැතිනම් කැපසරුප් ලෙස තමන් ම සාදා ගැනීමට හෝ අනුදැන වදාරා තිබෙනවා.

වප් පොහෝ දින මහා පවාරණ විනය කර්මය සිදු කොට වස් පවාරණය සිදු කිරීම ශාසනික ක්‍රමයයි. වස් පවාරණයත් සුවිශේෂී චාරිත්‍ර විදියක්. වප් පොහෝ දින සීමාමාලකයකට රැස්වන භික්ෂූන්වහන්සේ වැඩිමහල් පිළිවෙලින් තමාගේ වරදක් දුටුවේ, ඇසුවේ හෝ සැක කළේ නම් එය පෙන්වා දෙන ලෙසත්, තමා එය පිළිගෙන ඊට පිළියම් කිරීමට සූදානම් බවත් කියා සිටිනවා. මෙහි දී වැඩිමහල් බව නොසලකා වරද පෙන්වා දීමට අවස්ථාව ලැබෙනවා. මෙය සුවිශේෂ

තත්ත්වයක්. භාග්‍යවතුන්වහන්සේ දේශනා කොට තිබෙන "අඤ්ඤමඤ්ඤ වචනේන අඤ්ඤමඤ්ඤ වුට්ඨාපනේන" ඔවුනොවුන්ගේ කාරුණික වචනයෙන්, ඔවුනොවුන්ගේ සහායයෙන් වරද නිවැරදි කරගැනීමට, එයින් නැගී සිටීමට හැකියි යන්න ක්‍රියාත්මක කෙරෙන කදිම අවස්ථාවක් ලෙස මෙය පෙන්වා දෙන්න පුළුවන්.

වප් පොහෝ දිනෙන් ඇරඹෙන ඉල් පොහෝ දිනෙන් අවසන් වන මාසය තුළ වස් ආරාධනා කළ ගිහි පින්වතුන්ට කඨින පින්කම් සිදු කිරීමේ භාග්‍ය උදාවෙනවා. මෙසේ කඨින චීවර පූජාවක් භාරගැනීමට සුදුසුවීමට නම් භික්ෂූන් වහන්සේ ඉහත සඳහන් ආකාරයට වස් කඩ  නො කරගෙන මහා පවාරණයෙන් පවාරණය වී සිටිය යුතු ය. ඒ අනුව ගිහි පින්වතුන්ට මේ සුවිශේෂී පූජාව සිදු කර ගැනීමට භික්ෂූන් වහන්සේ මාස තුනක් පුරා කැපවීමකින් යුතුව වාසය කළ යුතු බව පේනවා. එම නිසා වස් කාලය ගිහි පැවිදි දෙපාර්ශ්වයේ අන්‍යෝන්‍ය සම්බන්ධතාව හොඳින් වර්ධනය වන දෙපාර්ශ්වයේ ම සීලාදී ගුණ දියුණු කරගත හැකි වැදගත් කාලයක් බව පැහැදිලි වෙනවා.

මේ පොහෝ දින සිට ඉදිරියට එන මාසයක කාලය කඨින පින්කම් සිදුකෙරෙන කාලය යි. අටමහා කුසල්වලින් එකක් වන කඨින පින්කම්වලට සම්බන්ධ වී විශාල පිනක් රැස්කර ගැනීමට එම කාලයේ දී ඔබට අවස්ථාව තිබෙනවා. ඉදිරි පොහොයේ දී අපි කඨින පින්කමේ අනිශංස ඉගෙන ගනිමු.



# ගුණ මල් මිටක්

*සිරිල් හේවාවසම් කිවිඳු*

බුදු දහම අදහන
දරුවනි! ඔබට යහ ගුණ
පුරුදු වන මඟ ගැන
ලියමි කවියෙන් හිතට ගනු මැන

අනුන් පණ සුරකිමු
සොරකම් කිසිත් නො කරමු
යහගුණෙන් සපිරෙමු
මුසා බස් කිසිවිටෙක නො කියමු

සුරාවෙන් වැළකී
පන්සිල් රකිනු යෙහෙකී
ගුණ දහමින් මෙකී
බැඳී සිටියොත් හැමට සෙතකී

රට - දැයට ලැදි අය
නිති පන්සිල් රකින අය
එක් වී - පහත් අය
ඇසුරු නො කළොත් වන්නෙ හොඳමය

කම්මැළිව බොරුවට
නො නිදා අවේලාවට
පාඩම් කරන විට
මතු දියුණ සැලසේවි ඔබහට

හිමිදිරියෙ පිබිදෙමු
තෙරුවන් නැමැඳ පේවෙමු
මවුපියනට වඳිමු
දවසෙ වැඩ මෙත් සිතින් අරඹමු

දෙගරුන් ගෙ සෙනෙහස
ලබා ගෙන - පාසල දෙස
යොමා හිත දැඩි ලෙස
ගමන් අරඹමු උදෑසන යසස

එතැන් සිට ගුරුවරු
තමා ඔබෙ මව් පියවරු
හැම දෙනට කීකරු
දරුවා ඔබ යි ගුණ සරු

මවු පියන් නො පුදන
වැඩිහිටියන් ද නො තකන
අය වැඩි ය වත්මන
එය විනාසෙකි රට ම පිරිහෙන

දිනෙන් දින වයසට
පත්වන මවුපියන්හට
සැලකීම හැම විට
පිනෙන් සපිරෙන දෙයකි මතුවට

අප කුඩා වයසේ
කවා - පොවමින් හොඳ සේ
උගන්වා නිසි සේ
අප හැදුවෙ මවු පියොයිමෙ ලෙසේ

යහ සිරිතින් සැදී
යහ මඟ යමින් පැහැදී
යහපතෙහි ම යෙදී
නඟමු රට - දැය - සමය දිරි දී



# දරුවා අනාගත අභියෝග ජයග්‍රහණය සඳහා හැඩ ගස්වමු

දිනෙන් දින ම ඔබ ගේ දරුවා පියවර මනින්නේ අලුත් ලොවකට ය. එය ඔබ දුටු ලෝකයට වඩා හාත්පසින් ම වෙනස් වූවක් විය හැකි ය. 21 වන සියවසේ ලෝකය ආර්ථිකය, නව තාක්‍ෂණය හා විද්‍යාව අතින් විස්මය දනවන ලෙස ඉදිරියට ගොස් ඇත. ආර්ථිකය, අධ්‍යාපනය, විද්‍යුත් තාක්‍ෂණය, ගමනාගමනය ආදිය පමණක් නොව මිනිසා ගේ සාමාන්‍ය ජන ජීවිතය ද මේ නිසා විශාල වෙනස්කම්වලට භාජන වී ඇත. මේ විවිධ අංශයන්හි ඉක්මන් දියුණුව තවත් පැත්තක අඳුරු සේයා පෙන්නුම් කර ඇත.

ලෝකයේ ආර්ථික - දේශපාලන හා සමාජීය වෙනස්කම් ඉදිරියෙහි ඔබේ දරුවා එයින් ගලවා සඟවා තැබීමට ඔබට හැකියාවක් නැත. එසේ කළහොත් එය ද දරුවාට අනතුරක් විය හැකි ය. එසේ නම් ඔබ කළ යුතු වන්නේ පළමු ව ඔබ බුද්ධිමත් ව ලෝකයේ ඉහත සඳහන් කළ විවිධ සමාජ අභියෝග ඉදිරියෙහි ඔබේ දරුවා ඊට සාර්ථක ව අභීත ව මුහුණ දිය හැකි

වන පරිදි පෙළ ගැස්වීම යි, හැඩ ගැස්වීම යි. ඔබ ගේ වටිනා අත්දැකීම් ඇසුරින් ලැබෙන ඒ හැඩ තල දරුවාට අභියෝගවලට ද අභියෝග කළ හැකි පෞරුෂයක් ලබා දෙනු නොඅනුමාන යි.

දෙමවුපියන් ලෙස, වැඩිහිටියන් ලෙස, ගුරුවරුන් ලෙස ඒ සඳහා ඔබ සතු වගකීම වෙනදටත් වඩා ගැඹුරින් කල්පනා කිරීම අත්‍යවශ්‍ය වේ. ධර්මානුකූල වූ ආදර්ශය තුළ ගොඩනැගෙන පරිසරයෙහි වැඩෙන දරුවා අභියෝග ජය ගැනීමට අවශ්‍ය කරන පෞරුෂය නොමඳ ව ලබාගනී.

බෞද්ධ සංකල්පය අනුව දරුවා ගේ පෞරුෂ වර්ධනය ඇරඹෙන්නේ මවු කුසේ සිට ය. තමා ගේ සංසාරගත කර්ම ශක්තියත් මව ඇතුළු සමීපස්ථයන් ගේ චින්තන පෝෂණයත් දරක පෞරුෂයට බෙහෙවින් උපස්තම්භක වේ. වෙසෙසින් ම මව ගේ බලපෑම එහිලා ඉස්මතු වේ. කල්‍යාණ මිත්‍රත්වය සියලු දියුණුවට හේතු වන බව බුදු සමය අවධාරණය කරයි. කල්‍යාණ මිත්‍රත්වයෙන් සමාජය නිර්මාණය වන්නේ නම් කිසි තැනෙක කිසිවකුට හෝ අභියෝග මතු නො වේ. ඒ භාග්‍යත්වයෙන් අද මුළු ලොව ම දුප්පත් වී ඇත.

තෘෂ්ණා දාසත්වය, තරගකාරිත්වය, පටු ආත්මාර්ථකාමිත්වය, බල අරගලය, අධිපරිභෝජනය, මිනිසා මිනිසාට ම එරෙහි ව කුරිරු වීම මේ ආදි දහසකුත් එකක් හේතු සාධක මත ගොඩනැගෙන ප්‍රපංච ලෝකය

තුළ අභියෝගවලින් තොර ව යන ගමනක් කැලම දැක්ක නොහැකි ය. ඒවා අනෙක් අයුරකින් කෙලෙසුනට වසඟ වීම නැත හොත් මාරාවේශය සේ හැඳින්වීම වරද නො වේ.

මතු පිටින් ප්‍රකට ව පෙනෙන සමාජීය අභියෝග සාර්ථක ව දිනිය හැක්කේ අභ්‍යන්තරයෙන් ඒවාට බලපාන හේතු සාධක නුවණින් කල්පනා කිරීමෙනි. දරුවා ගේ ලෝකයේ සුරක්ෂිත භාවයට මවුපියන් ගේ ආදරය ඉතා වැදගත් වේ. ඒ ආදරයට පුළුල් වටිනාකමක් ලැබෙන්නේ එය භෞතිකත්වය ඉක්මවා ඥනාන්විත ආදරයක් වූ තැන ය. දරුවා ඉල්ලන ඉල්ලන දේවලින් ඔහු හෝ ඇය සතුටු කිරීම ආදරය යැ යි බොහෝ දෙනා කල්පනා කරති. එය ආදරයේ ප්‍රාථමික තත්ත්වයකි. ඊට එහා ගිය අර්ථාන්විත ආදරයක් දරුවා වෙත පිරිනැමීමට දෙමවුපියන් දක්ෂ විය යුතු ය. උපායශීලි විය යුතු ය.

දරුවාට යහපත් ලෝකයක් නිර්මාණය කර දීමේ වගකීම ඇති දෙමවුපියන් හා වැඩිහිටියන් බොළඳ සිතිවිලි හා බොළඳ ක්‍රියාවන්හි ගැලී සිටීම අතිශයින් ම ඛේදජනක ය. ඇතැම් දෙමවුපියන් දරුවා වෙනුවෙන් සිය යුතුකම අමතක කර දමා බොහෝ වේලාවක් රූපවාහිනී තිරය ඉදිරිපස සිටීම, සිය යහළුවන් සමඟ අල්ලාප සල්ලාපයේ යෙදීම, දරුවා රිසි වන ලෝකයෙහි නිදහසේ ඉන්නට හැර තමතමන් ගේ අභිමතය පරිදි කටයුතුවල නිරත ව සිටීම වැනි කරුණු නිසා දරුවන්

අවිචාරවත් ක්‍රියාවන්ට පෙළඹෙන අයුරු අද බහුල ව දැක්ක හැකි ය.

මවුපිය දෙදෙනා සිය දරුවා යහපත් චර්යාවන් ගෙන් සැරසිය යුතු වන්නේ සෙසු ප්‍රජාව කෙරෙහි ද අනුකම්පනයක් ඇති ව ය. (පජාය අනුකම්පකා) අද දරුවා ගේ ලෝකය බෙහෙවින් ම තරගකාරි ය, ව්‍යාකූල ය, ඉන්ද්‍රිය වසඟයෙන් නොමඟ යවන සුලු ය. මායාකාරී ය, අසාධාරණයෙන් හෝ මුදල් උපයා ඉක්මනින් පොහොසත් වීමට සමාජයෙන් ම ලැබෙන බලපෑම් බොහෝ ය. මිනිසාට වඩා භාණ්ඩවලට ලැබෙන තැන ඉහළ අගයක් ගනී. තමන් ගේ අපේක්ෂා ඉටු නොවන විට අසහනයට පත් ව බලාත්කාරයෙන් හෝ ඒවා ලබා ගැනීමට උත්සුක වෙයි. ආත්ම සංයමය, ඉන්ද්‍රිය සංවරය, චිත්ත දමනය හුදෙක් වචන භාවිතයට ම සීමා වෙයි. හෙට උපදින දරුවාට පියවර තැබීමට සිදු වන්නේ මෙබඳු විෂම ස්වභාවයන් ගෙන් ගහණ පරිසරයක ය.

ඔබේ දරුවාට එල්ල වන අභියෝග අතර ඉහත සඳහන් කරුණු ඉදිරියෙන් ම සිටී. මේවාට විසැඳුම් සෙවීම් අරබයා ඔබ ප්‍රඥාසම්පන්න ද? සැබැවින් ම ධර්මයෙන් බල ගැන්වුණු, කරුණාවේ හා ප්‍රඥාවේ චින්තනයෙන් සාරවත් වුණු, මානුෂීය ගුණාංගවලින් පරිපෝෂණය වුණු ධර්මමය පෞරුෂයක් ඔබ ගේ දරුවා තුළ ඇති කිරීමට ඔබ සමත් වන්නේ නම් ඔහු හෝ ඇය ඉහත සඳහන් අභියෝගවලින් සාර්ථක ව ජය ගනු නියත ය

: දහමින් ම ය කවර හෝ ඉසුරක් සුවයක්, දියුණුවක් සැබෑ ලෙසට ඔබේ දරුවාට අත් පත් කර දිය හැක්කේ. මේ කරුණ අගතිගාමී නො වී දූරදර්ශී ව ඔබට බැලිය හැකි නම් එය මුළු මහත් මානව සමාජයේ ම යහපත පිණිස ඒකාන්තයෙන් හේතු වනු ඇත. දහමින් පිබිදුණු තැනැත්තා මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන විශිෂ්ට ගුණාංගයන් ගෙන් ශක්තිමත් ව සිටින හෙයින් ලොව කිසිදු අභියෝගයක් ඔහුට හෝ ඇයට අභියෝග යක් නොවනු ඇත.

*"ගුරු සීයා" විසිනි*

## පස්කම් සැපයෙහි ගිජුවීම

**පුප්ඵානි හේව පචිනන්තං - ඛ්‍යාසත්තමනසං නරං**
**අතිත්තං යේව කාමේසු - අන්තකෝ කුරුතේ වසං**

(ධම්මපදය - පුප්ඵ වග්ගය)

මල් කඩා රැස් කරන්නාවූ මාලාකාරයකු මෙන් මේ ලෝකයෙහි පස්කම් සැපයට ගිජු වූ මිනිසා එයින් සෑහීමකට පත් නොවී මාරයාගේ වසඟයට යන්නේ ය.



# පිය මහ රජුනි

රන්මැලි සෑය විය දිවි අඹරට  නැඟුණ
සුදෙවුන් පියා විය සක්විති මඟ  තනන
සමනළ පව්ව විය දුක සැප සම  ගලන
පිය මහ රජුනි අප ගෙපැලේ රජ  කරන

අසනි වැසි රුදුරු වග වලසුන්  අතරේ
සිවු මහ දෙවිඳු වී නිති රැකවල්  සැදුවේ
හිරුටත් කලින් අවදි ව කෙත්වත්  තැනුවේ
බෝසත් පාරමී ගුණයෙනි අප  වැඩුවේ

බුදුදස් නිරිඳු සේ අත් බෙහෙතක්  හදලා
පැල ඉන් වැටෙත් ගණපති රූපය  ඇඳලා
තුසිතෙක ඉසුරු පැල වට සිවු කොන  තබලා
ලොවුතුරු සුව විඳී අප රජ වනු  දැකලා

*රැසැයුම: පූජ්‍ය කිරම සුමංගල හිමියන්ගෙනි.*
*සුනිල් එදිරිසිංහයන් ගේ ගායනයකි.*



# කාලායමුට්ඨී ජාතකය

*කොළඹ විශාඛා විදුහලේ විශ්‍රාම ලත් ආචාර්යාණි*
*ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි*

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර පින් බිමෙහි දී කෝසල රජු නිසා මෙම ජාතක ධර්මය වදාළ සේක.

කොසොල් රජුහට තම රාජ්‍යයේ පිටිසර බද පෙදෙසක සතුරු ආක්‍රමණයක් ඇති බව දැනගන්නට ලැබුණි. ඒ වැසි සහිත දුෂ්කර කාලයකි. එසේ වුවත් තමන් ගේ සේනාව සංවිධානය කොට රජතුමා දෙව්රම් වෙහෙර අසබඩ කඳවුරු බැඳ ගත්තේ ය. මෙම වැසි සමයෙහි අප බුදුපියාණන් වහන්සේ වැඩ වාසය කරනු ලැබූයේ දෙව්රම් වෙහෙරෙහි ය. මෙම පුවත දැනගත් කොසොල් රජ දෙව්රමට ගොස් බුදුරජාණන් වහන්සේ දැක, සුළු කොට තැකිය හැකි මෙම ආක්‍රමණය මැඩ පැවැත්වීමට යා යුතු ද නැතහොත් තම රාජ්‍යයේ පාලනය දැහැමින් කර ගැනීම වඩා වටින්නේ දැයි විමසී ය. ප්‍රශ්නයට සවන් දුන් බුදුපියාණෝ කරුණු දෙකක් ඉදිරිපත් කරමින් එහි යෑම නුසුදුසු යැයි වදාළහ. පෙර කල දී පවා රජවරු දුෂ්කර කාලයන්හි දී තමන්ට අවැඩ සලසන ගමන් උතුමන් ගේ බස් අසා නොගිය බව පෙන්වා දීමට උන් වහන්සේ අතීත කථාව වදාළ සේක.

පෙර කල බඹදත් රජුගේ ප්‍රධාන අමාත්‍යවරයා වූයේ අප මහ බෝසතාණෝ ය. රජතුමා හා ප්‍රධාන අමාත්‍යවරයා එක් පසල් දනව්වක කලහයක් සංසිඳවීමට යන අතරමඟ දී විවේක සුවයෙන් පසුවූහ. සේවකයෝ රජුගේ අශ්වයනට ආහාර ගෙනැවිත් දුන්හ. මෙය දුටු ගසෙක සිටි වඳුරෙක් අසුන් ගේ ආහාර මිටක් රැගෙන ගොස් අත්තක වාඩි වී කන්නට විය. එවිට එම ආහාරයේ තිබූ කඩල ඇටයක් බිම වැටුණි. කඩල ඇටය ගැන ලොබ වූ වඳුරා අතේ තිබූ ආහාර ඉවත දමා, ගසින් බිමට බැස කඩල ඇටය සොයන්නට විය. තණ පඳුරු අතරට වැටුණු කඩල ඇටය සොයා ගත නොහැකි වූ වඳුරා නැවත ගසට නැග ශෝකයෙන් වටපිට බලනු රජු මෙන් ම ප්‍රධාන ඇමති වූ බෝසතාණෝ දුටුහ. එවිට බෝසතාණෝ "එක කඩල ඇටයක් නිසා වඳුරා අතේ තිබූ ආහාර නැති කර ගත්තා නොවේදැයි රජුහට පැවසූහ. එසේ ම යම්කෙනෙකු සුළු දෙයක් නිසා වටිනා දෙයක් හෝ අවස්ථාවක් නැති කර ගත යුතු නැතැයි පැවසූහ. එවැනි අයගේ ගතිගුණ හා ක්‍රියාවන් වඳුරාට සමාන නොවේදැ"යි බෝසතාණෝ රජුගෙන් ඇසූහ.

මේ අවවාදයෙන් පසු කෝසල රජතුමා සටන අතහැර නැවත නගරයට ගියහ. සටනට නොගියහොත් සතුරු උවදුර පහව යන්නට පුළුවන. වඩා වටිනා රාජ්‍යය පාලනය අතහැර රට වැසියන් අනතුරෙහි දැමීමට නොහැකි බව කල්පනා කළේ ය.

උදාහරණ ලෙස දරුවෝ කුසීත බව වැනි අනුවණ දෑ නිසා මහඟු අවස්ථාවන් මඟහැර ගනිති. තමන් ගේ සහජ දක්ෂතා පෙන්වීමට නොහැකි වෙති. අද දිනටත් මනාව ගැළපෙන මෙම උපදේශය අනුව ක්‍රියා කළහොත් ඔබට ද ජීවිතය ජයගත හැකි ය.